**එක්සත් ජාතික පක්ෂය**
ஐக்கிய தேசியக் கட்சி
**United National Party**

2026.01.07

## <u>සිරිකොත එක්සත් ජාතික පක්ෂ මූලස්ථානයේදී VIII වැනි විධායක ජනාධිපති සහ එජාප නායක රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේදී ගත් තීරණ.</u>

සමගි ජන බලවේගයේ නායක, විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාගේ ආරාධනයට අනුව එක්සත් ජාතික පක්ෂයේ  කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයන් කිහිප දෙනෙකු පසුගිය දා හමුවින. ඒ අනුව අද (07) දින එක්සත් ජාතික පක්ෂ කෘත්‍යෘධිකාරී මණ්ඩලයට නිල වශයෙන් මේ සාකච්ඡාව පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරන ලදී.

පක්ෂ දෙක අතර තිබෙන කටයුතු ඉදිරියට ගෙන යාමට එකමුතුව කටයුතු කිරීමට කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් එකඟතාවය පල කරන ලදි.

මේ පිළිබඳව පළමු පියවර හැටියට එක්සත් ජාතික පක්ෂයත්, සමගි ජන බලවේගයත් අතර ඒකාබද්ධ වැඩපිළිවෙලකට එකඟවීමට තීරණය කෙරිණි. ඉන්පසුව එක්සත් ජාතික පක්ෂයෙන් සහ සමගි ජන බලවේගයෙන් ප්‍රකාශ වූ කරුණු සැළකිල්ලට ගනිමින් පහත යෝජනා කිහිපය ඉදිරිපත් කිරීමට තීරණය කරනු ලැබීය.

1. ජාතික වශයෙන් පළාත් පාලන ආයතනවල, නගර සභා, ප්‍රාදේශීය සභාවල එක්සත් ජාතික පක්ෂයත්  සමගි ජන බලවේගය අතර සිටින පළාත් පාලන ආයතන මන්ත්‍රීවරුන්ගේ වැඩ කටයුතුවලදී වැඩ කිරීම සඳහා ඒකාබද්ධ ජාතික වැඩසටහන් කමිටුවක් පක්ෂ දෙකෙන් පත්කිරීම.

2. කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් ඒකාබද්ධ වැඩසටහන් 3 කට කරුණු ඉදිරිපත් කිරීම.

3. දැනට වෙනත් දේශපාලන පක්ෂ සමග කටයුතු කරන අතර, එම පක්ෂ වලටද මේ කරුණු පැහැදිළි කිරීමටත්, එමෙන්ම ඒ ගැන සාකච්ඡා කිරීමට පක්ෂ දෙකේ නායකයන්ගේ අනුමැතියෙන් කමිටුවක් පත් කිරීම.

4. මෙම වැඩපිළිවෙලට එකඟ වූ පසු එක්සත් ජාතික පක්ෂ නායක සහ සමගි ජන බලවේගයේ නායක මුණ ගැසීමට ක්‍රියා කිරීම.

5. ඉන්පසුව පක්ෂ දෙකෙහි කෘත්‍යාධිකාරී මණ්ඩල ඒකාබද්ධව මුණ ගැසී සාකච්ඡා කිරීම.

6. එමෙන්ම එක්සත් ජාතික පක්ෂය සහ අනෙකුත් දේශපාලන පක්ෂ ප්‍රමුඛ සන්ධාන අතර ගිවිසුම් පිළිබඳවත්, අප සම්බන්ධ වී කටයුතු කරන පක්ෂත්, සමගි ජන බලවේගය සමග එකමුතු වී කටයුතු කරන අතර, එම සියලු පක්ෂ දැනුවත් කිරීම.

එක්සත් ජාතික පක්ෂය.
2026.01.07


**මධ්‍යම කාර්යාංශය** மத்திய பணியகம் **Central Bureau**
"සිරිකොත මන්දිරය", 400, කෝට්ටේ පාර, පිටකෝට්ටේ, ශ්‍රී ලංකාව.
"சிரிகொத இல்லம்", 400 கோட்டே றோட், பிட்டகோட்டே, இலங்கை.
"Sirikottha House", 400, Kotte Road, Pitakotte, Sri Lanka.
Tel: 0112865374 / 0112865375 Fax : 0112865380
E-mail : gnunp@sltnet.lk Web : www.unp.lk


